# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1992 අංක 41 දරන

# ජාතික සමාජ සංවර්ධන ආයතනය

# පනත

---

[සහතිකය සටහන් කළේ 1992 අගෝස්තු මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 අගෝස්තු මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 7 රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 1.35 යි. තැපැල් ගාස්තුව : රු. 1.55 යි.

# 1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතනය පනත

[සහතිකය සටහන් කළේ 1992 අගෝස්තු මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 40/89

**ජාතික සමාජ සංවර්ධන ආයතනය පිහිටුවීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.**

1. මේ පනත 1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතනය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට එය ක්‍රියාත්මක වන්නේ ය.

## I වන කොටස

## ජාතික සමාජ සංවර්ධන ආයතනය පිහිටුවීම

**ජාතික සමාජ සංවර්ධන ආයතනය පිහිටුවීම.**

2. (1) (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) "ජාතික සමාජ සංවර්ධන ආයතනය" යනුවෙන් හැඳින්වෙන ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) ආයතනය (1) වන උපවගන්තියෙන් ඊට දෙන ලද නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් වන අතර, ඒ නාමයෙන් නඩු පැවරීම සහ ඊට විරුද්ධව නඩු පවරනු ලැබීම කරනු ලැබිය හැකි ය.

**ආයතනයේ අරමුණු.**

3. සමාජ වැඩ සහ සමාජ සංවර්ධන අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සහ විශේෂයෙන්, ම—

(අ) සමාජ වැඩ සහ සමාජ සංවර්ධන අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම්, වැඩ සටහන් සහ වැඩ කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම ;

(ආ) සමාජ වැඩ සහ සමාජ සංවර්ධනය පිළිබඳ උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම ;

(ඇ) සමාජ සුභ සාධන ක්‍රම සහ සමාජ සංවර්ධන වැඩ සටහන් පිළිබඳව අධ්‍යයන කටයුතු පැවැත්වීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) සමාජ වැඩවල දී තාක්ෂණය උපයෝගී කර ගැනීම ඇතුළුව සමාජ වැඩ සහ සමාජ සංවර්ධන අධ්‍යාපන ක්‍රමයෙහි නිර්මාණාත්මක පරිචයක් ආරම්භ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම ;

(ඉ) සමාජ සුභ සාධන ක්‍රමයේ කාර්ය මණ්ඩලයේ වෘත්තීයමය සහ කළමනාකාරිත්ව ප්‍රවීණතාව වර්ධනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම ;

(ඊ) සමාජ වැඩ සහ සමාජ සංවර්ධනය සම්බන්ධයෙන් විශේෂඥ සේවාවන් ආණ්ඩුවට සහ වෙනත් අනුමත සංවිධානයන්ට ලබා ගැනීමට සැලැස්වීම ;

(උ) ඒ සමාන අරමුණු ඇති වෙනත් ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම

ආයතනයේ අරමුණු වන්නේ ය.

2– ඩී 022690– 5,705 (92/05)

ආයතනයේ බලතල.

4. ආයතනයට පහත දැක්වෙන බලතල ඇත්තේ ය :—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම සහ දැරීම සහ එම දේපළ විකිණීම, බදුදීම, උකස් කිරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම :

එසේ වුවද ආයතනයේ නිශ්චල දේපළ කිසිවක් අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ලියවිල්ලකින් නොලබා විකුණනු නොලැබිය යුතු ය ;

(ආ) යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරි කිරීමේ සහ තැන්පතු ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම ;

(ඇ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත පුද්ගලයන්ගෙන් හෝ පුද්ගල මණ්ඩලවලින් ප්‍රදාන හෝ පරිත්‍යාග භාර ගැනීම ;

(ඈ) ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ස්වකීය කාර්ය ඉටු කිරීම සඳහා හෝ අවශ්‍ය සියලු ගිවිසුම්වලට ඇතුළුවීම සහ ඒවා ඉටු කිරීම ;

(ඉ) (87 වන අධිකාරය වූ) භාර ආඥාපනතේ 20 වන වගන්තියේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ භාර මුදල් ආයෝජනය කිරීම නීත්‍යානුකූල වන්නා වූ යම් සුරැකුම්පත ආයෝජනය නොකළ ආදායමක් ඇතුළු ආයතනයට අයත් යම් මුදල් ආයෝජනය කිරීම, හෝ එවැනි යම් මුදලක් ශ්‍රී ලංකාව තුළ නිශ්චල දේපළක් මිලට ගැනීම සඳහා ආයෝජනය කිරීම හෝ එවැනි ආයෝජන වෙනස් කිරීම හෝ ක්ෂණික වියදම් සඳහා අවශ්‍ය නොවන ඒ මුදලේ යම් කොටසක් යම් බැංකුවක ස්ථිර තැන්පතුවක තැබීම ;

(ඊ) සමාජ වැඩ සහ සමාජ සංවර්ධනයේ යම් අංශයකට අදාළ පර්යේෂණ, සමීක්ෂණ සහ විමර්ශන ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම, පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීම ;

(උ) සමාජ සුබ සාධනයෙහි නිරත නිලධරයන් හා වෙනත් කාර්ය මණ්ඩලය සඳහා පුහුණුවීමේ පාඨමාලා සහ ශික්ෂණ වැඩ සටහන් පවත්වාගෙන යාම ;

(ඌ) සමාජ සංවර්ධනයට අදාළ යම් නිශ්චිත පර්යේෂණ ව්‍යාපෘතියක් හෝ ව්‍යාපෘති සඳහා යම් තැනැත්තකුට, තැනැත්තන් කණ්ඩායමකට හෝ යම් පිළිගත් ආයතනයකට හෝ ආයතනවලට ප්‍රදානයන් කිරීම ;

(එ) අධ්‍යයනය කිරීමේ සහ පුහුණුවීමේ කාර්ය සඳහා මධ්‍යස්ථාන පිහිටුවීම, ඒවාට උපකරණ සැපයීම සහ පවත්වාගෙන යාම

(ඒ) ආයතනයේ කාර්යය සඳහා පුස්තකාල සහ රසායනාගාර ඉදි කිරීම, ඒවාට උපකරණ සැපයීම සහ පවත්වාගෙන යාම සහ සමාජ සංවර්ධනය සම්බන්ධයෙන් පර්යේෂණ සහ අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය වෙනත් සේවාවන් සැපයීම ;

(ඔ) කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන් හුවමාරු කරගැනීම සඳහා සහ සාමාන්‍යයෙන් ස්වකීය පොදු අරමුණුවලට හිතකර විය හැකි යම් කාර්ය සඳහා ආයතනයේ අරමුණුවලට සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් සමාන අරමුණු ඇත්තා වූ ශ්‍රී ලංකාවේ හෝ විදේශීය අධ්‍යාපන හෝ වෙනත් ආයතන සමග සහයෝගිතාවය සඳහා ගිවිසුම්වලට ඇතුළත් වීම ;

(ඕ) ආයතනය විසින් ඉටු කරනු ලැබූ යම් සේවාවන් සඳහා ගාස්තු හෝ අය කිරීම් නියම කිරීම ;

(ක) නියම කළ යුතු යයි මේ පනතින් නියමිත සියලු කාරණා සම්බන්ධයෙන් රීති සෑදීම ; සහ

(ග) ස්වකීය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනයේ මතය අනුව අවශ්‍ය වන හෝ හිතකර වන හෝ ආනුෂංගික වෙනත් සියලු ක්‍රියා හෝ දේ කිරීම.

5. 4 වන වගන්තියෙන් ආයතනය වෙත පවරා දෙන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව ආයතනය විසින්, පහත දැක්වෙන ශාස්ත්‍රීය බලතල ක්‍රියාත්මක කළ යුතු ය, කර්තව්‍ය සහ කාර්ය ඉටු කළ යුතු ය :— ආයතනයේ ශාස්ත්‍රීය බලතල.

(අ) විශ්ව විද්‍යාලවල හෝ ඉගෙනීම ලබන ස්ථානවල, ආයතනවල තත්ත්වය ඒ විශ්ව විද්‍යාලවල හෝ ඉගෙනීම ලබන ස්ථානවල හදාරන ලද අධ්‍යයන පාඨමාලා පවත්වනු ලැබූ කාලය කෙරෙහි සැලකිල්ල ඇතිව, ආයතනයට ඇතුළත් වීමට අපේක්ෂා කරන තැනැත්තන් විසින් හෝ ආයතනයේ ශිෂ්‍යයන් විසින් ඒ විශ්ව විද්‍යාලවල දී හෝ ඉගෙනීම ලබන ස්ථානවල දී හෝ සමර්ථ වූ විභාග සහ ඉගෙනීම ලැබූ හෝ අධ්‍යයනය හැදෑරූ කාලසීමාවන් පිළිගැනීම සහ එම කරුණුම කෙරෙහි සැලකිල්ල ඇතිව ඒ පිළිගැනීම යම් අවස්ථාවක දී ඉවත් කර ගැනීම ;

(ආ) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය මහාචාර්ය ධුර සහ වෙනත් ශාස්ත්‍රීය තනතුරු ඇති කිරීම ;

(ඇ) ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග ඇති කිරීම සහ ප්‍රදානය කිරීම ; සහ

(ඈ) අධ්‍යාපන විද්‍යායතන සහ සමාජ සංවර්ධන අධ්‍යාපනය සම්බන්ධයෙන් ඒ සමාන ආයතන අනුබද්ධ ආයතන වශයෙන් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව ලියාපදිංචි කිරීම සඳහා කොන්දේසි රීති මගින් නියම කිරීම.

3—ඩී 022690– 5,705 (92/05)

ආයතනයේ පරිපාලනය සභාව වෙත පවරනු ලැබිය යුතු බව.

6. (1) ආයතනයේ කටයුතු පරිපාලනය, කළමනාකරණය සහ පාලනය (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ සභාව වෙත පවරනු ලැබිය යුතු ය.

(2) ආයතනයේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා සභාව විසින්, මේ පනතින් ආයතනය වෙත හෝ ආයතනයට පැවරුණු, භාර කෙරුණු හෝ නියම කෙරුණු බලතල, කර්තව්‍ය සහ කාර්යය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය ; ඉටු කරනු ලැබිය යුතු ය.

(3) තත් කාර්ය සඳහා සාදන ලද, නියෝග ප්‍රකාර, පස් අවුරුදු වැඩ සැලැස්මක්, වාර්ෂික සැලැස්ම සහ වැඩ සටහන සහ වාර්ෂික අයවැය පිළියෙල කිරීම සභාවේ කාර්යය විය යුතු අතර, ඒ සැලසුම්, වැඩ සටහන් සහ වාර්ෂික අයවැය අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබීම සඳහා ඔහු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

සභාවේ සංයුතිය.

7. (1) සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) නිල බලයෙන් සාමාජිකයන් වන තැනැත්තන්, එනම් :—

(i) (මෙහි මින් මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) සභාපතිවරයා විය යුතු සමාජ සුභ සාධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් ; සහ

(ii) 11 වන වගන්තිය යටතේ පත් කරන ලද ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ආ) වෙනත් සාමාජිකයන්, එනම් :—

(i) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, උසස් අධ්‍යාපනය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ නියෝජිතයෙක් ;

(ii) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතින් පිහිටුවන ලද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන නියෝජිතයන් දෙදෙනෙක් ;

(iii) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන මුදල් පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ; සහ

(iv) සමාජ වැඩ සහ සමාජ සංවර්ධනය යන ක්ෂේත්‍රයන්හි වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද ඇති තැනැත්තන් අතුරෙන් අමාත්‍යවරයා විසින් [illegible] කරනු ලබන වෙනත් තැනැත්තන් අට දෙනෙක්.

(2) යම් තැනැත්තකු, තමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නම් හෝ එසේ පත් වන්නේ නම් හෝ ඔහු සභාවේ සාමාජිකයකු වශයෙන් පත්වීමට හෝ එසේ කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු වන්නේ ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරනු ලබන සභාවේ සෑම සාමාජිකයකු ම –

(අ) අමාත්‍යවරයා විසින් ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුව හොත් ; හෝ

(ආ) අමාත්‍යවරයා අමතන ලද ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඔහු ඉල්ලා අස්වීමේ දී එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලියවිල්ලකින් පිළිගනු ලැබුවහොත්

එවැනි සාමාජිකයකු වශයෙන් ධුරය අත්හළ යුතු ය.

(4) (අ) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරන ලද සභාවේ සාමාජිකයකු මියයන හෝ ඉල්ලා අස් වන හෝ ධුරයෙන් ඉවත් කරනු ලබන අවස්ථාවක, මිය යන, ඉල්ලා අස්වන හෝ ධුරයෙන් ඉවත් කරනු ලබන සාමාජිකයා වෙනුවට, වෙනත් තැනැත්තකු සාමාජිකයකු වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(ආ) මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරන ලද සභාවේ යම් සාමාජිකයකු ස්වකීය ධුරයෙන් කලින් ඉල්ලා අස්වුවහොත් හෝ මියගොස් හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා ධුරය අත්හැරියහොත් මිස, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවූ කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(5) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරන ලද සභාවේ යම් සාමාජිකයකු රෝගාතුරවීම නිසා හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ ස්වකීය ධුරයේ කාර්යය කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවෙන් වැඩ බැලීම සඳහා අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(6) (9) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරන ලද සෑම සාමාජිකයකු ම, මියයාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා කලින් ධුරය අත්හරිනු ලැබුවහොත් මිස, තමා ඒ ධුරයට පත් කරනු ලැබූ දින සිට අවුරුදු හතරක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය.

(7) සභාවේ නිල බලයෙන් පත් කරනු ලබන සෑම සාමාජිකයකුම තමා සභාවේ සාමාජිකයකු වූයේ යම් තනතුරක් ප්‍රකාර ද ඒ තනතුර දරන තාක් කල් ධුරය දැරිය යුතු ය.

(8) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (iv) වන අනු ඡේදය යටතේ පත් කරන ලද සභාවේ සාමාජිකයන් අතුරෙන් හරි අඩක් සෑම දෙවන වර්ෂයේ දීම විශ්‍රාම යා යුතු ය.

(9) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (iv) වන අනුඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයන් අතුරෙන් හරි අඩක් සෑම දෙවන වර්ෂයකදීම විශ්‍රාම යෑමේ සුරැකීමේ කාර්යය සඳහා, අමාත්‍ය වරයා විසින් එසේ නිශ්චිතව සඳහන් කර ද්‍රව්‍යමයෙන් සභාවට පත් කරන ලද සාමාජිකයන් හතර දෙනාකුගේ ධුර කාලය, පත් වීමේ දින සිට අවුරුදු දෙකක කාලසීමාවක් ඉකුත්වීමෙන් පසු අව සන් කරනු ලැබිය යුතු ය.

(10) (3) වන උපවගන්තිය යටතේ ඉවත් කරනු ලැබීමෙන් හැර, අන්‍යාකාරයකින් ස්වකීය ධුරය අත්හරින යම් සාමාජිකයකු නැවත පත් කිරීම සඳහා සුදුස්සෙකු වන්නේ ය.

(11) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් පාරිශ්‍රමිකයක් ආයතනයේ අරමුදලෙන් සභාවේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය හැකි ය.

ආයතනයේ මුද්‍රාව. 8. ආයතනයේ මුද්‍රාව—

(අ) සභාව විසින් කලින් කල නිශ්චය කරනු ලබන යම් තැනැත්තෙකු භාරයේ තිබිය යුතු ය ;

(ආ) සභාව විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය ; තව ද

(ඇ) සභාවේ අනුමතිය ඇතිව මිස තමා පැමිණ සිටිය බවට සළකුණක් වශයෙන් යම් ලියවිල්ලකට අත්සන් තැබිය යුතු සභාවේ සාමාජිකයකු ඉදිරියේ දී හැර, ඒ ලියවිල්ල මත නොතැබිය යුතු ය.

සභාවේ රැස්වීම්. 9. (1) සභාපතිවරයා හෝ ඔහු නොපැමිණි විටක දී ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සභාවේ රැස්වීම්වල මූලසුන දැරිය යුතු ය. සභාපතිවරයා හා අධ්‍යක්ෂ ජනරාල්වරයා යන දෙදෙනා ම නොපැමිණි විටක දී පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා ගනු ලබන සාමාජිකයකු ඒ රැස්වීම්වල මූලසුන දැරිය යුතු ය.

(2) යම් රැස්වීමක ගණපූරණය සඳහා සභාවේ සාමාජිකයන් හතර දෙනකුට නොඅඩු විය යුතු ය.

(3) සභාවේ යම් රැස්වීමක තීරණය කළ යුතු සියලු ප්‍රශ්න පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතරයක ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සමතාවක දී සභාපතිවරයාට හෝ සභාවේ යම් රැස්වීමක මූලසුන දරන වෙන යම් සාමාජිකයකුට තමාගේ ඡන්දයට අතිරේකව තීරණ ඡන්දයක් තිබිය යුතු ය.

(4) මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට යටත් ව, සභාව විසින්, සභාවේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු පිළිබඳව එහි කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

(5) සාමාජිකත්වයෙහි යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන් ම පමණක් හෝ එහි සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් ම පමණක් හෝ සභාවේ කිසිම ක්‍රියාවක් හෝ තීරණයක් හෝ කටයුත්තක් බල රහිත නොවිය යුතු ය.

10. (1) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ අධ්‍යයන කටයුතු මණ්ඩලයක් තිබිය යුතු ය. අධ්‍යයන කටයුතු මණ්ඩලයේ සංයුතිය.

(2) ආයතනයේ අධ්‍යයන කටයුතු මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

නිල බලයෙන් සාමාජිකයන් වන තැනැත්තන්, එනම් :—

(i) 11 වන වගන්තිය යටතේ පත් කරන ලද, ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ii) සභාපතිවරයා විසින් තීරණය කරනු ලබන පරිදි ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් ;

(iii) ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(iv) මේ පනත යටතේ සාදන ලද නියෝගවලින් නියම කරන ලද පරිදි ශ්‍රී ලංකාවේ එක් එක් විශ්ව විද්‍යාලයෙන් එක් නියෝජිතයෙක්.

(3) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය ආයතනයේ අධ්‍යයන කටයුතු සම්බන්ධයෙන් වගකිව යුතු ය.

(4) තත් කාර්ය සඳහා සාදන ලද රීතිවලට අනුකූලව ආයතනය විසින් පවත්වනු ලබන විභාග පැවැත්වීම සම්බන්ධයෙන් මණ්ඩලය වගකිව යුතු අතර, නියමිත විභාග සමත් වී වෙනත් නියමිත කොන්දේසි සපුරාලූ ආයතනයේ උපාධි, ඩිප්ලෝමා සහතික පත්‍ර සහ ආයතනයේ වෙනත් අධ්‍යයන විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් ලැබූ තැනැත්තන් සභාවට නිර්දේශ කළ යුතු ය.

(5) (3) වන උපවගන්තියෙන් මණ්ඩලය වෙත පැවරුණු බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව මණ්ඩලය විසින්, පහත දැක්වෙන බලතල, කාර්ය හා කර්තව්‍යය ක්‍රියාත්මක කළ යුතු ය ; ඉටු කරනු ලැබිය යුතු ය :—

(අ) සියලු අධ්‍යයන කරුණු සම්බන්ධයෙන් සභාවට උපදෙස් දීම ;

(ආ) සභාව විසින් මණ්ඩලය වෙත යොමු කරනු ලබන කවර හෝ කරුණක් පිළිබඳව සලකා බලා වාර්තා කිරීම ;

(ඇ) ආයතනය විසින් කර ගෙන යනු ලබන හෝ පවත්වාගෙන යනු ලබන අධ්‍යයන පාඨමාලා, ඉගැන්වීමේ වැඩ සටහන් විභාග සම්බන්ධ කරුණු පිළිබඳව සභාවට නිර්දේශ සහ වාර්තා ඉදිරිපත් කිරීම ;

(ඈ) ආයතනය විසින් පවත්වනු ලබන විභාගවල දී පරීක්ෂක වරයන් වශයෙන් පත් කිරීම සඳහා සුදුසු තැනැත්තන් ගේ නම් සභාවට නිර්දේශ කිරීම;

(ඉ) මහාචාර්ය තනතුරු හා වෙනත් අධ්‍යයන ශ්‍රේණි ඇති කිරීම, අහෝසි කිරීම හෝ අත්හිටුවීම සම්බන්ධයෙන් සභාවට නිර්දේශ කිරීම;

(ඊ) ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා වූ කොන්දේසි සභාවට නිර්දේශ කිරීම;

(උ) යම් ශිෂ්‍යත්ව, පදක්කම් සහ ත්‍යාග ප්‍රදාන කිරීම සඳහා සභාව විසින් අනුමත කරන ලද කොන්දේසි සපුරාලූ යම් තැනැත්තන්ට අනුව ශිෂ්‍යත්ව සහ වෙනත් ත්‍යාග ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් සභාවට නිර්දේශ කිරීම; සහ

**(ඌ) මණ්ඩලයේ සාමාජිකයන් නොවන තැනැත්තන් ඇතුළත්** වන් කමිටු, සභාවේ අවසරය ඇතිව පත් කිරීම.

(6) (3) වන හෝ (4) වන උපවගන්තිවල සඳහන් යම් කාරණයකට අදාළ කිසිම තීරණයක්, ඒ කාරණය පිළිබඳව ස්වකීය නිර්දේශ සටහන් කිරීමේ සහ සභාව වෙත ප්‍රේෂණය කිරීමේ අවස්ථාව මණ්ඩලයට ලබා දුනහොත් මිස, සභාව විසින් හෝ ඒ කාරණයට අදාළ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් තමා වෙත පවරනු ලැබූ යම් නිලධරයකු විසින් හෝ කරනු නොලැබිය යුතු ය. එබඳු යම් කාරණයක් පිළිබඳ සභාවේ හෝ ඒ නිලධරයාගේ තීරණය මණ්ඩලයේ නිර්දේශයට පටහැනි වන අවස්ථාවක මණ්ඩලයේ නිර්දේශ අනුගමනය නොකිරීම සම්බන්ධයෙන් ස්වකීය හේතු සභාව විසින් හෝ ඒ නිලධරයා විසින් සටහන් කරනු ලැබිය යුතු ය.

## II වන කොටස

### ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ ආයතනයේ කාර්ය මණ්ඩලය පත් කිරීම

**ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම.**

11. (1) ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු වූ ද, ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයා වූ ද (මෙහි මින්මතු "අධ්‍යක්ෂ ජනරාල්" යනුවෙන් හඳුන්වනු ලබන) අධ්‍යක්ෂ ජනරාල්වරයකු අමාත්‍යවරයා විසින් ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල් වරයා මියයාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා කලින් ධුරය අත්හරින්නේ නම් මිස, තමාගේ පත්වීමේ දින සිට අවුරුදු හතරක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු ය.

(3) සභාවේ පොදු විධානයට යටත්ව ආයතනයේ කටයුතු පරිපාලනය සහ ආයතනයේ කාර්ය මණ්ඩලය පාලනය අධ්‍යක්ෂ ජනරාල් භාරයේ පැවතිය යුතු ය. තව ද සභාවේ සියලු තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඔහු වගකිව යුතු ය.

(4) ආයතනයේ අරමුණු ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සලකනු ලබන ප්‍රතිපත්ති සහ ක්‍රියා මාර්ග සභාව විසින් සලකා බැලීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉදිරිපත් කළ යුතු ය.

(5) සභාව විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරනු ලබන යම් බලතල හෝ කාර්ය ඔහු විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය.

(6) මේ පනතින් හෝ ඒ යටතේ පිහිටුවනු ලද යම් මණ්ඩලයක හෝ වෙනත් එවැනි මණ්ඩලයක යම් රැස්වීමක දී පැමිණ සිටීමට, කථා කිරීමට සහ ඡන්දය දීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට හිමිකම ඇත්තේ ය.

(7) අධ්‍යක්ෂ ජනරාල්වරයා—

(අ) තම කාර්ය ඉටු කිරීමෙහි ලා ස්ථිර වශයෙන් අශක්තු තාවයට පත්වුවහොත් ; හෝ

(ආ) වංචනික හෝ නීති විරෝධි ස්වභාවයකින් හෝ නැත හොත් ආයතනයේ අරමුණුවලට ප්‍රත්‍යක්ෂ ලෙස විරුද්ධ බවට අමාත්‍යවරයාගේ මතය වන යම් ක්‍රියාවක් හෝ දෙයක් ඔහු විසින් කරනු ලැබ ඇත් නම් ; හෝ

(ඇ) ජාතික ප්‍රතිපත්තියට පටහැනිව ඔහු ක්‍රියා කළහොත්

අමාත්‍යවරයා විසින් ලියවිල්ලකින් ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(8) අධ්‍යක්ෂ ජනරාල් ධුරය දරන්නාගේ මරණය සිදුවීම මත, (7) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබීම මත හෝ තත් කාර්ය සඳහා අමාත්‍යවරයා අමතන ලද ලිපියක් මගින් ඉල්ලා අස්වූ විට අධ්‍යක්ෂ ජනරාල් ධුරය හිස් වන්නේ ය.

(9) (7) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවේ නම් හිස අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් පත් කරනු ලැබූ යම් තැනැත්තකු අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් නැවත පත් කිරීම සඳහා සුදුස්සෙක් වන්නේ ය.

(10) අධ්‍යක්ෂ ජනරාල් ධුරයේ පුරප්පාඩුවක් ඇති වූ විට (1) වන උපවගන්තිය යටතේ පත්වීමක් කරනු ලබන තෙක් අධ්‍යක්ෂ ජනරාල් ධුරයේ කාර්ය ඉටු කිරීමට අමාත්‍යවරයා විසින් සභාවේ සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

(11) අධ්‍යක්ෂ ජනරාල්වරයා ආයතනයේ ගිණුම් නිලධරයා වන්නේ ය.

ආයතනයේ කාර්ය මණ්ඩලය.

12. (1) මේ පනතේ විධිවිධානවලට සහ අමාත්‍යවරයා විසින් සාදනු ලද යම් නියෝගවලට යටත්ව—

(අ) ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය වන ආයතනයේ යම් නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට ;

(ආ) එසේ පත් කරන ලද නිලධරයන්ට සහ සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික තීරණය කිරීමට සහ ඔවුන් කෙරෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීමට ; සහ

(ඇ) එසේ පත් කරන ලද නිලධරයන්ගේ සහ සේවකයන්ගේ ප්‍රතිලාභය සඳහා වූ යෝජනා ක්‍රම සහ අර්ථසාධක අරමුදල් පිහිටුවීමට සහ ඒවා විධිමත් කිරීමට

සභාවට බලය ඇත්තේ ය.

(2) සභාවේ බලතල සහ කර්තව්‍ය සභාව විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාට පවරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් පවරා දෙනු ලැබූ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සභාවේ විධානවලට යටත්ව ඒ බලය, කාර්යය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ යම් බලය පවරාදීමක් කරනු ලැබුව ද එසේ පවරා දෙනු ලැබූ බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට සභාවට බලය ඇත්තේ ය.

ඇතැම් ගිවිසුම්වල කාර්යය සඳහා ආයතනයේ සේවය ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස සැලකිය යුතු බව.

13. යම් නිශ්චිත කාලසීමාවක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත් වූ යම් තැනැත්තකු ආයතනය විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ආයතනයට කරනු ලබන යම් සේවා කාලයක්, ඒ ගිවිසුමේ බැඳීම් නිදහස් කරලීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

ආයතනයේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

14. (1) සභාවේ ඉල්ලීම පිට, රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකුගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, එවැනි නිලධරයකු එවැනිම කැමැත්ත ඇතිව ආයතනය විසින් නිශ්චය කරනු ලබන කාලසීමාවකට ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කිරීම හෝ එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කිරීම කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ යම් නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13(2) වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13(3) වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) සභාවේ ඉල්ලීම පිට, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද යම් උසස් අධ්‍යාපන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ ඒ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ කැමැත්ත ඇතිව, එවැනි ම කැමැත්ත ඇතිව සභාව විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැත හොත් එවැනි ම කැමැත්ත ඇතිව සභාව සහ ඒ ප්‍රධාන විධායක නිලධරයා විසින් විශ්‍රාම වැටුප් සහ අර්ථ සාධක අරමුදල් අයිතිවාසි යම් සම්බන්ධයෙන් වූ කොන්දේසි ඇතුළු යම් කොන්දේසි මත එකඟව ඒ කාර්ය මණ්ඩලය ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

## III වන කොටස

## මුදල්

15. (1) පාර්ලිමේන්තු යෝජනා සම්මතයකින් තත් කාර්ය සඳහා ආයතනයට ප්‍රදානය කරනු ලබන යම් මුදල් ආයතනයේ ආරම්භක ප්‍රාග්ධනය විය යුතු ය. ආයතනයේ ආරම්භක ප්‍රාග්ධනය.

(2) ආයතනයේ ප්‍රාග්ධනය නීතියෙන් හෝ පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයකින් බලය දෙනු ලබන යම් මුදල් ප්‍රමාණයක් ගෙන් කලින් කල වැඩි කරනු ලැබිය හැකි ය.

16. (1) ආයතනයට ආයතනයේ ම අරමුදලක් තිබිය යුතු ය. ආයතනයේ අරමුදල.

(2) (අ) ආයතනයේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් ;

(ආ) ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී ආයතනය ලබන සියලු මුදල් ; සහ

(ඇ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත කවර වූ හෝ ප්‍රභවයකින් ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් ආයතනයට ලැබෙන සියලු මුදල්

ආයතනයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (අ) මේ පනත යටතේ ආයතනයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේදී ආයතනය විසින් දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් ; සහ

(ආ) මේ පනතින් හෝ මේ පනත යටතේ ඒ අරමුදලින් ගෙවීමට අවශ්‍ය සියලු මුදල්

ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ආයතනයේ මුදල් වර්ෂය.

17. ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

ගිණුම් විගණනය කිරීම.

18. රාජ්‍ය සංස්ථාවක ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන ආයතනයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## IV වන කොටස
## සාමාන්‍ය විධිවිධාන

සභාවට අදාළව අමාත්‍යවරයා සතු බලතල.

19. (1) ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටු කිරීම සඳහා මේ පනතේ 10 (3) හෝ 10 (4) වන වගන්තියේ සඳහන් යම් බලතල ක්‍රියාත්මක කිරීම හෝ යම් කාර්යයක් ඉටු කිරීම හැර ඒ සම්බන්ධයෙන් වූ සාමාන්‍ය විධාන අමාත්‍යවරයා විසින් කලින් කල සභාවට ලිඛිතව නිකුත් කළ හැකි අතර, සභාව විසින් ඒ විධාන ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) ආයතනයේ කටයුතු සියල්ල හෝ ඉන් කිසිවක් තමා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන තැනැත්තකු හෝ තැනැත්තන් විසින් විමර්ශනය කරනු ලැබ ඒ පිළිබඳව වාර්තා කළ යුතු බවට අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි අතර එවැනි නියමයක් කරනු ලැබූ විට, ඒ නියමය ක්‍රියාත්මක කිරීමෙහි ලා අවශ්‍ය සියලු පහසුකම් සැලසීම සහ සියලු තොරතුරු සැපයීම සභාව විසින් කරනු ලැබිය යුතු ය.

(3) සභාව විසින් ඉදිරිපත් කරනු ලබන පස් අවුරුදු වැඩ සැලැස්ම, වාර්ෂික සැලැස්ම, වැඩ සටහන් සහ වාර්ෂික අයවැය සංශෝධනය ඇතිව හෝ නැතිව අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි ය.

වංචල සහ නිශ්චල සහ විද්‍යාගාර ...යන් වූ රජයේ දේපළ ආයතනය වෙත ලබාදිය යුතු බව.

20. (1) රජයේ යම් නිශ්චල දේපළක් ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය වන අවස්ථාවක, එම කාර්යය රජයේ ඉඩම් ආඥා පනතේ 6 වන වගන්තිය යටතේ එම දේපළ සම්බන්ධයෙන් විශේෂ ප්‍රදානයක් හෝ බද්දක් දෙනු ලැබිය හැකි කාර්යක් ලෙස සලකනු ලැබිය යුතු ය. තව ද එම දේපළ සම්බන්ධයෙන් ආයතනයට විශේෂ ප්‍රදානයක් හෝ බද්දක් දීමේ දී ඒ ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) රජයේ යම් චංචල දේපළක් ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය වන අවස්ථාවක, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් එම දේපළවල සන්තකය සහ ප්‍රයෝජනය ආයතනය වෙත පවරා සත කොට දෙනු ලැබිය හැකි ය:

එසේ වුවද රජයේ යම් චංචල දේපළක් කෙරෙහි පාලනය ඇත්තා වූ අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව ඒ දේපළ කෙරෙහි බලපාන කිසිම නියමයක් මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ නොකළ යුතු ය.

21. අවශ්‍ය යයි සලකනු ලබන යම් ඉඩම්, ගොඩනැගිලි සහ වෙනත් පහසුකම් කිසිවක් රජය විසින් ආයතනයේ ප්‍රයෝජනය සඳහා සලසා දෙනු ලැබිය හැකි ය.

**ආයතනයේ ප්‍රයෝජනය සඳහා ස්ථාන ආදිය රජය විසින් ලබා දිය යුතු බව.**

22. ආයතනයේ එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු මාස හයක කාලසීමාවක් ඉකුත්වීමට පෙරාතුව, සභාව විසින් එම වර්ෂය තුළ ආයතනයේ කටයුතු සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තරයක් දැක්වෙන වාර්තාවක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, අමාත්‍යවරයා විසින් එහි පිටපත් පාර්ලිමේන්තුවේදී සභාගත කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

**ස්වකීය කටයුතු සම්බන්ධයෙන් සභාව විසින් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බව.**

23. ආයතනය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන එපරිද්දෙන් තේරුම් ගත යුතු ය.

**ආයතනය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සැලකිය යුතු බව.**

24. ආයතනයේ සියලු සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

**ආයතනයේ සාමාජිකයන් සහ සේවා නියුක්තයන් රජයේ සේවකයන් වශයෙන් සැලකිය යුතු බව.**

25. (1) (අ) මේ පනත යටතේ ආයතනය විසින් සද්භාවයෙන් කරනු ලබන හෝ කරන ලද්දේ යයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ආයතනයට විරුද්ධව ද ;

(ආ) මේ පනත යටතේ හෝ සභාවේ විධානය මත සභාවේ යම් සාමාජිකයකු, ආයතනයේ නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් සද්භාවයෙන් කරනු ලබන හෝ කරන ලද්දේ යයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව ද

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

**මේ පනත යටතේ කරනු ලැබූ ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.**

(2) (1) වන වගන්තියේ සඳහන් එවැනි යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ හෝ සභාවේ විධානය මත හෝ කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී එකී ක්‍රියාව කරන ලද්දේ සද්භාවයෙන් යයි අධිකරණය තීරණය කරන්නේ නම් ඔහු විසින් දරන ලද යම් වියදම් ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

නියෝග.

26. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, පහත දැක්වෙන කාරණා සියල්ල හෝ ඉන් යම් කාරණයක් සඳහා සහ ඒ සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) ආයතනයේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ පාරිශ්‍රමික ඇතුළු සේවා නියම සහ කොන්දේසි ;

(ආ) ආයතනයේ නිලධරයන් සහ සේවකයන් බඳවා ගැනීමේ ක්‍රමය සහ පත් කිරීම සඳහා කාර්ය පටිපාටිය :

(ඇ) මණ්ඩලයේ සංයුතිය සහ එහි කටයුතු පවත්වා ගෙන යාම

(ඈ) ආයතනයේ පස් අවුරුදු වැඩ සැලැස්ම, වාර්ෂික සැලැස්ම සහ වැඩ සටහන සහ වාර්ෂික අයවැය පිළිබඳ ආකෘතිය ඒ වැඩ සැලැස්ම, වාර්ෂික සැලැස්ම හා වැඩ සටහන සහ අයවැය පිළියෙල කළ යුතු ආකාරය ; සහ

(ඉ) නියම කළ යුතු යයි මේ පනතින් නියමිත හෝ සෑදිය යුතු යයි මේ පනතින් බලය දෙනු ලැබූ නියෝග සෑදිය යුතු යම් කාරණා.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ ඒ පළ කරනු ලැබූ දින සිට හෝ නියෝගයෙහි සඳහන් යම් පසු දිනයක සිට ඒ ක්‍රියාත්මක විය යුතු ය.

(3) සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි පහසු දිනයක අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, එහි අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කරන ලද යම් දෙයකට හානියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කළ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

27. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1.160 යි. කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 295, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.